# රාජ්‍ය සේවා කොමිෂන් සභාව - උතුරු මැද පළාත

## උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ උපස්ථායක තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීම - 2026

උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ උපස්ථායක (ප්‍රාථමික අර්ධ ශිල්පීය ) තනතුරේ III ශ්‍රේණියේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා විවෘත පදනම මත සුදුසුකම්ලත් ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ. පුරප්පාඩු සංඛ්‍යාව 05කි. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2026.08.28 වේ.

**01. අයදුම් කිරීම සඳහා මූලික සුදුසුකම් :-**

I. **අධ්‍යාපන සුදුසුකම්** :- සිංහල/ දෙමළ භාෂාව ඇතුළුව ඕනෑම විෂයයන් දෙකකට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විෂයයන් හයක් සමත්ව තිබීම.

II. **වෘත්තීය සුදුසුකම්** :- රජයේ රෝහලක , බෙහෙත් ශාලාවක හෝ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි පුද්ගලික රෝහලක හෝ බෙහෙත් ශාලාවක හෝ පිළිගත් ආයතනයක උපස්ථාන කටයුතු පිළිබඳ වසර 01 ක පළපුරුද්දක් ලබා තිබීම.

III. **කායික සුදුසුකම්** :- සෑම අපේක්ෂකයෙකුම උතුරු මැද පළාත තුළ තනතුරේ රාජකාරි ඉටු කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්තවිය යුතුය.

IV. වෙනත් සුදුසුකම් :- අයදුම්කරු ශ්‍රී ලංංකාවේ පුරවැසියෙකු විය යුතුය.
විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාල සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කළ යුතුය.

**02. බඳවා ගැනීමේ ක්‍රමය** :-
මූලික සුදුසුකම් සපුරන අයදුම්කරුවන් අතුරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකදී ලබා ගන්නා ලකුණු වල ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීම සිදු කෙරේ.

**03. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය** :-

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන අතර, ලකුණු ලබා දීමේ ක්‍රමය පහතින් දැක්වේ.

| **ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර** | **උපරිම ලකුණු ප්‍රමාණය** | **තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය** |
|---|---|---|
| 1. උපස්ථායක තනතුරක රජයේ හෝ වෙනත් පිළිගත් ආයතනයක මාස 06ට වැඩි සේවා පළපුරුද්ද සඳහා | 25 | අදාළ නොවේ. |
| 2. ප්‍රායෝගික සුදුසුකම් මැන බැලීම ( එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් වාචික ප්‍රශ්න 05 කින් යුත් ප්‍රශ්නාවලියක් ) | 50 | |
| 3. රජයේ හෝ පිළිගත් ආයතනයක උපස්ථාන කටයුතු පිළිබඳ වසරක පළපුරුද්දක් ලබා තිබීම | 20 | |
| 4. සම්මුඛ පරීක්ෂණයේ දක්වන ලද කුසලතාවය | 05 | |
| **එකතුව** | **100** | |

* අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා අයදුම්කරුවන් විසින් අදාල සහතිකවල මුල් පිටපත් හා සහතික කළ පිටපත් පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

**04. සේවා කොන්දේසි :-**

I. බඳවා ගනු ලබන්නේ තනතුරේ III ශ්‍රේණියට ය.

II. සේවා ගණය - ප්‍රාථමික අර්ධ ශිල්පීය වේ.

III. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දි ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.

IV. බඳවා ගැනිමේ පරිපාටියේ නියම කර ඇති පරිදි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් විය යුතු අතර,රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට අනුෂාංගික හා භාෂා ප්‍රතිපත්තිය සඳහා ඉදිරියේදී නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා නීති රෙගුලාසිවලට යටත් විය යුතුය.

V. උතුරු මැද පළාත තුළ වසර 03 ක ස්ථිර පදිංචියක් තිබිය යුතු අතර , එය ග්‍රාම නිලධාරි සහතික මඟින් සනාථ කළ යුතු වේ.

VI. වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතුය , උපරිම වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ( දැනට රාජ්‍ය සේවයේ සිටින අය සඳහා මෙය අදාල නොවේ.)

VII. සුදුසුකම් සම්පූර්ණ කරන ලද තෝරා ගනු ලබන අයදුම්කරුවන් උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින සාලියපුර ශාන්ති සෙවණ වැඩිහිටි නිවාසය හා බුල්නෑව සුපසන් විශ්‍රාමික වැඩිහිටි නිවාසය යන ආයතනයන්හි පුරප්පාඩු පවතින ආයතනය වෙත අනුයුක්ත කරනු ඇත.

VIII. යම් ආගමික නිකායක හෝ පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකුට මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ නොහැක.

**05. වැටුප් ක්‍රමය :-**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව වැටුප් කේත අංක PL – 2 සේවා ගණයට අදාළව රු. 41,800-10x490-10x540-10x590-12x630-65,560/-වේ. මීට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව හා වෙනත් අදාළ දීමනාද මාසිකව ගෙවනු ලැබේ. ගෙවනු ලබන වැටුප ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව තීරණය කරනු ලැබේ.

**06. අයදුම් කළ යුතු ආකාරය :-** මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත අනුව A 4 කඩදාසියක දෙපැත්තම භාවිතා කර අයදුම්පත් සකස් කළ යුතු අතර, දින හෝ එදිනට පෙර අයදුම්කරුවන් තම අයදුම්පත් **" ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,උතුරු මැද පළාත "** යන ලිපිනය වෙත ඉදිරිපත් කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් සහ නියමිත දිනට නොලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**07. විශේෂ කරුණු :-** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු කුසලතා අනුපිළිවෙලේ ප්‍රමුඛතාවයට අනුව සේවා අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන පුරප්පාඩු සේවා ස්ථාන වෙත පත්කිරීම් සිදුකරනු ලැබේ. මෙම නිවේදනයේ සඳහන් කරුණු හා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි වනු ඇත.

**මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමේ අයිතියද කිසියම් පුරප්පාඩු වලින් කොටසක් හෝ මුලුමුනින්ම හෝ පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳ අවසන් තීරණය ගැනීමේ අයිතියද උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේය.**

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.
2026.08.07

**ආදර්ශ අයදුම්පත**

**උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ**

**උපස්ථායක තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීම - 2026**

01. I. අයදුම්කරුගේ නම(මුලකුරු සමඟ) :- ..........................................................

II. සම්පූර්ණ නම :- ..........................................................

02. I. ස්ථිර ලිපිනය ..........................................................

II. දුරකථන අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

III. ස්ත්‍රී / පුරුෂ භාවය : ☐ පුරුෂ - 1 ස්ත්‍රී - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

II. විවාහක / අවිවාහක භාවය ☐ විවාහක - 1 අවිවාහක - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

III. උපන්දිනය ☐☐☐☐ ☐☐ ☐☐

IV. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

03. අධ්‍යාපන සුදුසුකම් :-

I. අ.පො.ස. (සා.පෙළ)

**පළමුවර**

වර්ෂය :............................

විභාග අංකය :................................

| විෂය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

**දෙවනවර**

වර්ෂය :.............................

විභාග අංකය :..............................

| විෂය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

04. වෘත්තීය සුදුසුකම් :-

පාඨමාලාව :- ..........................................    පාඨමාලාව :- ..........................................

වලංගු වන දිනය :- ..........................................    වලංගු වන දිනය :- ..........................................

කාල සීමාව :- ..........................................    කාල සීමාව :- ..........................................

05. අයදුම්කරුගේ ප්‍රකාශය :-

ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනිම පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. එම තොරතුරු සත්‍ය හා නිවැරදි නොවන බව තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත්, විනයානුකූලව හා නීත්‍යානුකූලව කටයුතු කිරිමට යටත් වන බවත් දනිමි. තනතුරට තෝරා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් තනතුර අහිමි වන බවත්, විනයානුකූලව හා නිත්‍යානුකූලව කටයුතු කිරිමට යටත් වන බවත් දනිමි.

..............................    ..............................................
දිනය    අයදුම්කරුගේ අත්සන

06. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම:-

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ........................................................................ මයා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ............................................... වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

....................................
සහතික කරන නිලධාරියාගේ අත්සන

දිනය : .............................
සහතික කරන නිලධාරියාගේ නම : ...............................................................
තනතුර: .....................................................
(රාජකාරි ලිපිනය සහිත නිල මුද්‍රාව)